Applications.lk
Job Vacancies / Courses / Examinations / Gazettes / Applications

# වැලිගම නගර සභාව

වැලිගම  නගර සභාවේ පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරු සඳහා බඳවා ගැනීමට සුදුසුකම් ඇති අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| *තනතුරු නාමය* | *තනතුරු සංඛ්‍යාව* | *වැටුප් පරිමාණය* | *අවම අධ්‍යාපන සුදුසුකම්* |
|---|---|---|---|
| 1. රියදුරු III ශ්‍රේණිය | 01 | රා.ප.ච. 3/2016 අනුව PL3-2016, වැටුප් කාණ්ඩයේ ආරම්භක පියවර<br>රු. 25,790 - 10 x 270 -10 x 300 - 10 x 330 - 12 x 350 - රු. 38,990 | *අධ්‍යාපන*<br>දෙවරකට නොවැඩි වාර ගණනකදී අධ්‍යාපන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාග යෙන් ඕනෑම විෂයයන් 06ක් සමත් වී තිබිය යුතුය.<br><br>*ශිල්පීය නිපුණතා ප්‍රවීණතා*<br>පුරප්පාඩුව පවතින මෝටර් රථ වර්ගයෙහි රියදුරු තනතුරුවල ස්වභාවය මත රථ පැදවීම පිළිබඳව මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද මෝටර් රථ පැදවීමේ බලපත්‍රයක් හා නිපුණත්වය පිළිබඳ සහතිකයක් ලබා සිටිය යුතුය. මෝටර් රථ රියදුරු  බලපත්‍රය ලැබීමෙන් පසු අවම වශයෙන් වසර 03ක පළපුරුද්ද ලබා තිබිය යුතුය. |
| 2. බර වාහන යන්ත්‍ර ක්‍රියාකරු (කොන්ත්‍රාත්) | 01 | කොන්ත්‍රාත් පදනම මත | |

*වයස* :

ඉල්ලුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි විය යුතුය. (ස්ථිර තනතුරක සිටින අභ්‍යන්තර අයදුම්කරුවකුට උපරිම වයස් සීමාව අදාළ නොවේ.)

*වෙනත් සුදුසුකම්* :

(i) අයදුම්කරුවන් ශ්‍රී ලාංකිකයන් විය යුතු අතර අයදුම්පත් කැඳවන අවසාන දිනට දකුණු පළාත් සභා බල ප්‍රදේශයේ පූර්වාසන්න වසර 5ක අනුගාමී වසර 3ක ස්ථිර පදිංචිය සනාථ කළ යුතුය.

(ii) පදිංචි වසමේ ග්‍රාම නිලධාරී විසින් නිකුත් කරන ලද පදිංචි සහතිකය අනුව අදාළ ප්‍රාදේශීය ලේකම් විසින් අනු අත්සන් කර පදිංචිය සනාථ කර තිබිය යුතුය.

(iii) සෑම අපේක්ෂකයෙකුම දකුණු පළාතේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරී ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

(iv) අයදුම්කරු දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියක වරදකරුවෙකු කරනු ලැබූවෙකු හෝ පළාත් රාජ්‍ය සේවයෙන් පහකරනු ලැබූවකු නොවිය යුතුය.

*සේවයේ නිරත කිරීමේ කොන්දේසි* :

(i) රියදුරු III ශ්‍රේණියේ තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳව ඉදිරියේ දී රජය විසින් ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයන්ට ඔබ යටත් විය යුතුය.

(ii) බර වාහන යන්ත්‍ර ක්‍රියාකරු තනතුර කොන්ත්‍රාත් පදනම මත වන අතර, සේවක අර්ථසාධක අරමුදලට හා සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලේ සාමාජිකත්වයට ඇතුළත් වනු ඇත.

(iii) පත්වීම අවුරුදු 03ක පරිවාස කාලයකට යටත් වන අතර වසර 03ක පරිවාස කාලය අවසානයේ වැඩ, පැමිණීම, හැසිරීම යහපත් තත්ත්වයේ පවතින අයට පමණක් ස්ථිර පත්වීම් ප්‍රදානය කරනු ලැබේ. III වන ශ්‍රේණියට පත් වී 04 වන වැටුප් පියවරට පෙර පළමු කාර්යක්ෂමතා කඩඉම සමත් විය යුතුය.

(iv) මෙම බඳවා ගැනීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික ජනරජයේ ආයතන සංග්‍රහයේ රෙගුලාසිවලටද, මුදල් රෙගුලාසි වලටද පළාත් සභා හා පළාත් රාජ්‍ය සේවයේ හෝ දකුණු පළාත් සභාව විසින් වරින් වර නිකුත් කරනු ලබන වෙනත් චක්‍රලේඛ හෝ රෙගුලාසිවලට හා දෙපාර්තමේන්තු නියෝගවලට අනුකූලව ක්‍රියාත්මක කිරීමට සියලුම සේවකයන් බැඳී සිටී.

*ඉල්ලුම් කළ යුතු ආකාරය* :

අයදුම්කරු මෙහි පහත දක්වා ඇති ආදර්ශ අයදුම්පත අනුව A4 ප්‍රමාණයේ කඩදාසියක පිළියෙල කරන ලද අයදුම්පත 2019.07.14 දිනට හෝ ඊට පෙර ලැබෙන සේ සභාපති, වැලිගම නගර සභාව, වැලිගම යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ ඉල්ලුම්කරනු ලබන තනතුර සඳහන් කළ යුතුය. අසම්පූර්ණ අයදුම්පත් සහ නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් කැඳවීමෙන් පසුව හෝ මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම හෝ මෙම නිවේදනය අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීමේ පූර්ණ බලය වැලිගම නගර සභාවේ සභාපති සතු වේ.

අයදුම්පත් ඉදිරිපත් කර ඇති හා බඳවා ගැනීමට අවශ්‍යය අවම සුදුසුකම් සහිත අයදුම්කරුවන් සියලු දෙනා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකට යොමු කරනු ලැබේ. සම්මුඛ පරීක්ෂණය පැවැත්වෙන දිනය ඉදිරියේ දී දැනුම් දෙනු ලැබේ.

අයදුම්පත් සමග පහත සඳහන් සහතිකවල සහතික කරන ලද පිටපත් ඇමිණිය යුතු අතර, මුල් පිටපත් සම්මුඛ පරීක්ෂණයේ දී ඉදිරිපත් කළ යුතුය.

(1) උප්පැන්න සහතිකය,
(2) අධ්‍යාපන සහතික,
(3) මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද වාහන පැදවීමේ බලපත්‍රයේ පිටපතක්,

(4) පදිංචිය සනාථ කිරීම පිණිස මෑතකදී ලබා ගත් ග්‍රාම නිලධාරි සහතිකය (ප්‍රාදේශීය ලේකම් විසින් අනු අත්සන් කර තැබිය යුතුය.)

(5) මෑතකදී ලබාගත් චරිත සහතික 02ක්,

(6) පළපුරුද්ද පිළිබඳ සහතිකය.

රෙහාන් ඩී. ඩබ්ලිව්. ජයවික්‍රම,
සභාපති,
වැලිගම නගර සභාව.

2019 මැයි මස 28 වැනි දින,
වැලිගම නගර සභා කාර්යාලයේ දී ය.

### ආදර්ශ අයදුම් පත්‍රය

. . . . . . . . . . . . . . . . . . . . . . . . . *තනතුර සඳහා අයදුම්පත*

01. අයදුම්කරුගේ නම (මුලකුරු සමග) :——————————

02. මුලකුරු වලින් හැඳින්වෙන නම:——————————

03. තැපැල් ලිපිනය :——————————

04. දුරකථන අංකය :——————————

05. උපන් දිනය වර්ෂය :—————— මාසය :—————— දිනය :——————

06. ජාතික හැඳුනුම්පත් අංකය :——————————

07. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස :——————————
අවුරුදු:—————— මාස:—————— දින:——————

08. ස්ත්‍රී/පුරුෂ භාවය :——————————

09. විවාහක/අවිවාහක බව :——————————

10. ජාතිය :——————————

11. ඔබ ශ්‍රී ලාංකික පුරවැසියෙක්ද? එසේ නම් පරම්පරාවෙන් ද? ලියාපදිංචි වීමෙන් ද යන වග? :——————————

12. අධ්‍යාපන සුදුසුකම් :——————————

13. පළපුරුද්ද හා වෘත්තීය සුදුසුකම් :——————————

මෙම අයදුම්පත්‍රයේ මා විසින් සපයන ලද තොරතුරු සත්‍යවූත් නිවැරදිවූත් ඒවා බව මෙමගින් සහතික කරමි. මෙහි ඇතුළත් තොරතුරු කිසිවක් අසත්‍ය හෝ වැරදි බව මෙම තනතුර තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මා නුසුදුස්සෙකු වන බවත් පත්වීම ලැබීමෙන් පසු එවැනි කරුණක් ඔප්පු වුවහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බවත් මම දනිමි.

——————————;
අයදුම්කරුගේ අත්සන.

දිනය :——————.

*දැනට සේවයේ යෙදී සිටින අභ්‍යන්තර අයදුම්කරුවන් සම්බන්ධව ආයතන ප්‍රධානියාගේ නිර්දේශය*

අයදුම්කරුවන ..............................................මයා/මිය/මෙනවිය දනට මෙම ආයතනයේ ..................................................සේවකයෙකු ලෙස සේවයේ යෙදී සිටී. අයදුම් පත්‍රය නිර්දේශ කර/නොකර ඉදිරිපත් කරමි.

——————————;
ආයතන ප්‍රධානියාගේ අත්සන.
(නිල මුද්‍රාව සහිත)

දිනය :——————.